විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක: 02/2023

මගේ අංක :විවැ/චක්‍රලේඛ 2023
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව,
මාලිගාවත්ත,
කොළඹ 10.
2023.03.27

ජනාධිපති ලේකම්,

අග්‍රාමාත්‍ය ලේකම්,

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,

පළාත් ප්‍රධාන ලේකම්වරුන්,

කොමිෂන් සභා ලේකම්වරුන්,

දෙපාර්තමේන්තු ප්‍රධානීන් / දිස්ත්‍රික් ලේකම්වරුන්,

ප්‍රාදේශීය ලේකම්වරුන්,

පළාත් පාලන ආයතන ප්‍රධානීන්,

ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන්,

**<u>විශ්‍රාමික රජයේ නිලධාරීන් නැවත සේවයේ යෙදවීම</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් 2018.02.20 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2018 වෙත ඔබගේ අවධානය යොමු කරනු කැමැත්තෙමි.

02. අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ වයසට එළඹීමෙන් අනතුරුව විශ්‍රාම ගත් නිලධාරීන් නැවත සේවයේ යොදවනු ලැබුවහොත් හෝ පත්කරනු ලැබුවහොත් හෝ එකී විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප අවුරා තැබීමකින් තොරව අඛණ්ඩව ගෙවනු ලැබේ. ඔවුන්ට විශ්‍රාම වැටුප සමග රු.3525 ක ජීවන වියදම් දීමනාව ලැබෙන අතර නැවත සේවයේ යෙදවීම / පත් කිරීම යටතේ විශ්‍රාම වැටුප් සමග හිමිවන ජීවන වියදම් දීමනාවේ ඉතිරි අර්ධය ඔහු ලබන මාසික දීමනාව සමග ලබා දිය හැකිය.

03. විශ්‍රාමිකයින්ට විශ්‍රාම වැටුප් ගෙවීමේ දී රු. 5,000.00 මාසික දීමනාව ගෙවනු ලබයි. 2022.01.13 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2022 හා 2022.01.20 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 01/2022 හි විධිවිධාන අනුව නැවත සේවයේ යොදවා ඇති විශ්‍රාමික නිලධාරීන් සඳහා රු. 5,000.00 මාසික දීමනාව හිමිවනුයේ විශ්‍රාම වැටුප සඳහා පමණි.

04. මෙලෙස අනිවාර්ය විශ්‍රාම ගැන්වීමෙන් පසු කොන්ත්‍රාත් පදනම මත විශ්‍රාමික නිලධාරීන් නැවත සේවයේ යෙදවීමේ දී ජීවන වියදම් දීමනාව හා රු. 5,000.00 ක මාසික දීමනාව ද්විත්ව ගෙවීමක් සිදු විය හැකි අවස්ථාවන් අනාවරණය වී තිබේ. එසේම මෙලෙස නැවත සේවයේ යොදවනු ලබන නිලධාරීන් සම්බන්ධයෙන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව දැනුවත් කිරීම අදාළ ආයතන මගින් සිදු නොකරන බැවින් මෙවැනි ද්විත්ව ගෙවීම් වළක්වා ගත හැකි අවස්ථා අවම වී ඇත.

05. 2023 වසර සඳහා ඇස්තමේන්තුගත රජයේ වියදම් කළමනාකරණය පිළිබඳ විශේෂ උපදෙස් නිකුත් කර ඇති අතර ඇතිවිය හැකි අහිතකර ප්‍රතිවිපාක අවම කිරීම සඳහා රජයේ වියදම් වඩාත් ඵලදායී ලෙස භාවිතා කිරීම හා අත්‍යවශ්‍ය නොවන වියදම් හැකිතාක් අවම කළ යුතු බවට 2023.01.27 දිනැති අයවැය චක්‍රලේඛ 01/2023 මගින් උපදෙස් ලබා දී ඇත.

06. එබැවින් විශ්‍රාම වැටුප් අධිගෙවීම් කළමනාකරණය සඳහා ඇමුණුම 01 මගින් හඳුන්වා දී ඇති ආකෘතිය යටතේ, ඔබ ආයතනයේ කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවා ඇති විශ්‍රාමික නිලධාරීන් සම්බන්ධව මා වෙත වාර්තා කරන ලෙස කාරුණිකව දන්වමි.

**ඒ.ජගත් ඩී.ඩයස්**
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:
01. ලේකම්, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය - කරු.දැ.ගැ.ස

02. විගණකාධිපති - අ.කා.ස

ඇමුණුම 01

ආයතනයේ නම : ...........................................................................................................................

| නිලධාරියාගේ නම | ජාතික හැඳුනුම්පත් අංකය | විශ්‍රාම ගැන්වූ දිනය | කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවන කාල සීමාව .......... සිට ........ දක්වා |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

ඉහත තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි.

.....................................................................

ආයතන ප්‍රධානියාගේ අත්සන
නිල මුද්‍රාව